# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,165 - 2020 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2020.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 54 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 57 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 20 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 මාර්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


53 - B 82011 - 353 (2020/02)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, (දැනට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) එස්. එම්. පෙත්තාවඩු වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ, 19(4) උපවගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1995.12.15 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 48645 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන මැටියගනේ පදිංචි සුමුදුරගේ ඇල්බට් සිල්වා වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක F91/1657/96 යටතේ 1996.03.15 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු / ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2020.03.14 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ (දැනට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ), දඹදෙණි හත්පත්තුවේ උඩුකහ බටහිර කෝරළේ මැටියගනේ ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ (දැනට 1050 - ඊරියගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මැටියගනේ නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ.ග.පි. 239 දරන කට්ටි කැබීමේ පිඹුරේ / සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 265 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.273 ක විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම මැටියගනේ වත්ත :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 269, 267 හා 264, |
| *නැගෙනහිරට* | : | මිණිකුකුලගම හා 264, |
| *දකුණට* | : | කැබලි අංක 266 හා මිණිකුකුලගම, |
| *බටහිරට* | : | කැබලි අංක 266 හා 267. |

එස්. එම්. පෙත්තාවඩු,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2019 නොවැම්බර් මස 25 වැනි දින.

02-566

---

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර - නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. එච්. එම්. එන්. පී. දසනායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 15709 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හම්මාලිය, බණ්ඩාරකොස්වත්ත පදිංචි රන්කොත් පේඩි දූරයලාගේ මැනිකී යන අය වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඩී 56/1894/1987 යටතේ 1987.12.29 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.03.14 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සව පත්තුවේ/කෝරළේ 364 ගල්ලැහැපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය පලුගස්වෙල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කුරුණෑගල මිනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 02 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ විසින් සම්පාදිත අංක 2300 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 113 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.444 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගලගාවහේනඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 114 සහ 117, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 62 සහ 118, 2/2, |
| *දකුණට* | : | කැබලි අංක 111 සහ 112, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 112 සහ 54 පාර. |

ඩී. එච්. එම්. එන්. පී. දසනායක,
ප්‍රාදේශීය ලේකම් (*වැ.බ*).

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පඬුවස්නුවර නැගෙනහිර.
2019 දෙසැම්බර් මස 02 වැනි දින.

02-567

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ගෙදපළාවේ ගෙදර නිහාල් ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1988.03.04 වැනි දින ප්‍රදානය කර ඇති අංක බදු/ප්‍ර 10921 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බණ්ඩාරවෙල, කොළතැන්න හි පදිංචි බාදන මුදියන්සේලාගේ මුතුබණ්ඩා මයා වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ................. යටතේ ...................... දින ලියාපදිංචි කරනු ලැබ නොමැති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.03.27 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත පත්තුවේ/කෝරළේ කිණිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිණිගම (අ.ග.සි. 19) නැමති ගමේ පිහිටා ඇත්තා වූද අංක 45 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 19 දරන කට්ටි කැබීමේ පිඹුරේ/ අංක 1119 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.093 රූඩ් ............. පර්චස් ....................... ක් විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම තන්තිරියේ උල්පත පතන ඃ

*උතුරට* : කැබලි අංක 8ඩී අයි එෆ්, අයිඩී,
*නැගෙනහිරට* : කැබලි අංක 1120,
*දකුණට* : කැබලි අංක 1115,
*බස්නාහිරට* : කැබලි අංක 1118.

ජී. ජී. එන්. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්.

බණ්ඩාරවෙල.
2019 නොවැම්බර් මස 29 වැනි දින.

02-660

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කලුගල ප්‍රසාද් චාමින්ද වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.02.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/නැනුප/ප්‍ර/2758 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සුචරිතගම, අනුරාධපුර ලිපිනයේ පදිංචි රාජපක්ෂ පේඩිගේ සයිමන් වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 169/158 යටතේ 1997.05.09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.03.28 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 274 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු කළුවිල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අයි.එස්.පී.පී. 01 හි කට්ටි කැබීමේ පිඹුරේ අංක 596 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 00 අක්කර 01, රූඩ් 01 යි පර්චස් 26 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම වේඃ

*උතුරට* : අයි.එස්.පී.පී. 01 හි ඇල රක්ෂිතය හා කැබලි අංක 595,
*නැගෙනහිරට*: අයි.එස්.පී.පී. 01 හි කැබලි අංක 595,
*දකුණට* : අයි.එස්.පී.පී. 01 හි ඇල රක්ෂිතය හා කැබලි අංක 597,
*බස්නාහිරට* : අයි.එස්.පී.පී. 01 හි කැබලි අංක 597.

කේ. පී. චාමින්ද,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාච්චදූව.
2019 දෙසැම්බර් මස 17 වැනි දින.

02-659/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කලුගල ප්‍රසාද් චාමින්ද වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.03.16 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/931 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කළුවිල ලිපිනයේ පදිංචි රාජපක්ෂ පේඩිගේ සසිරා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර කාර්යාලයේ අංක 932 යටතේ 1982.06.07 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.03.28 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 12ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කළුවිල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අයි.එස්.පි.පි. 01 හි කට්ටි කැබීමේ පිඹුරේ අංක 597 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 00, අක්කර 01, රූඩ් 03 යි පර්චස් 10 ක් විශාලත්වය ඇත්තා වූ ද, උණගහකැලේ මූකලාන හා පරහකුපිටෙල යනුවෙන් දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම වේ:

*උතුරට* : කැබල අංක 5ඒ හා (පාර) සහ 596,
*නැගෙනහිරට*: කැබලි අංක 596,
*දකුණට* : පිට ඇල රක්ෂිතය,
*බස්නාහිරට* : කැබලි අංක 604 හා 605.

කේ. පී. චාමින්ද,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාච්චාදූව.
2019 දෙසැම්බර් මස 06 වැනි දින.

02-659/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කලුගල ප්‍රසාද් චාමින්ද වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.03.16 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/823 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කළුවිල ලිපිනයේ පදිංචි ජයලත් පේඩිදුරයලාගේ උක්කු වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 824 යටතේ 1982.06.07 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.03.28 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 12ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කළුවිල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අයි.එස්.පි.පි. 01 හි කට්ටි කැබීමේ පිඹුරේ .................. විසින් සම්පාදිත අංක .......................... දරන රේඛා සටහනේ අංක 568 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 00, අක්කර 01, රූඩ් 03 යි පර්චස් 29 ක් විශාලත්වය ඇත්තා වූ ද, පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම වේ:

*උතුරට* : කැබලි අංක 571 හා මල්වතුඔය රක්ෂිතය,
*නැගෙනහිරට*: මල්වතුඔය රක්ෂිතය,
*දකුණට* : කැබලි අංක 567 හා කැබලි අංක 5ඒ,
*බස්නාහිරට* : කැබලි අංක 571 කොටසක්.

කේ. පී. චාමින්ද,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාච්චාදූව.
2019 දෙසැම්බර් මස 17 වැනි දින.

02-659/1

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/60503.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-නිඉකො/හම්/ඉ2/සූරි/දීබදු/09.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 136, වැදිවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැදිවැව ගමේ අ. භූ. පි. 04 අතිරේක අංක 151 පත්‍ර අංක 455 පිඹුරේ කැබලි අංක C 6023 වන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්. 0.0640 ක් වාණිජ කටයුතු සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක C 6022 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක C 6022 සහ කැබලි අංක C 6028; |
| *දකුණට* | : | කැබලි අංක C 6028, කැබලි අංක C 6024 සහ කැබලි අංක C 6021 ; |
| *බටහිරට* | : | කැබලි අංක C 6024, කැබලි අංක C 6021 සහ කැබලි අංක C 6020. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.07.08 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සෑදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.07.08 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 පෙබරවාරි මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-565

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/28349.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය :-ත්‍රි/ඉ/මහ/R 28.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 1 පියවර, මහදිවුල්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහදිවුල්වැව ගමේ අංක කැඩැස්තර සිතියම් අංක 260187 හි කැබලි අංක 68 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0475 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා මුණසිංහ විතානගේ ඉන්ද්‍රානි මුණසිංහ මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : කැබලි අංක 47 සහ 67 ;
*නැගෙනහිරට* : කැබලි අංක 47, 67 සහ ටෝ. පෝ. පී. පී. 33 හි කැබලි අංක 240 ;
*දකුණට* : ටෝ. පෝ. පී. පී. 33 හි කැබලි අංක 240 සහ 69 ;
*බටහිරට* : කැබලි අක 69.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2019.11.05 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම 1995.06.15 දින සිට වසර 05ක් ගත වීමෙන් පසු හිමි වේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවාසේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීම සිදු වේ.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 පෙබරවාරි මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-661

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/45059.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-ප. ඉ. කො./06/කළු/148.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 821 C, අමරගෙදර උතුර ග්‍රාම නිලධාරි වසමේ අංක 19/2013 දරන අනුරේඛනයේ කැබලි අංක C ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0862ක් වූ රජයේ ඉඩම් කොටස සීමාසහිත අමරගෙදර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය වෙත දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ :

*උතුරට* : 19/2013 අනුරේඛනයේ බී කැබැල්ල සහ අ. හු. පි. 3 හි 1726 වැනි කැබැල්ල ;
*නැගෙනහිරට* : අ. හු. පි. 3 හි 1726 වැනි කැබැල්ල සහ 19/2013 අනුරේඛනයේ ඩී කැබැල්ල ;
*දකුණට* : 19/2013 අනුරේඛනයේ ඩී කැබැල්ල සහ මාර්ගය ;
*බටහිරට* : මාර්ගය.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2019.10.18 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කළ වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

*(ආ)* මෙම ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.10.18 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ඒ. එස්. නදීශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-610

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.